# නෙලුම් තහංචිය

(පැරණි පොතපත ඇසුරිණි)

1. ස ක ල   සතට මෙත් දරු අප සුගත තතාග   ත
නි ම ල   එතුම දෙසූ සද්දම් සතට වඩා මෙ   ත
වි පු ල   අරිය සඟ මෙම තුන් රුවනට නිසි යු   ත
න ල ල   යුගත දී නමදිමි සියලු දෙහොස නැ   ත

2. සෙ ත ක්   ලැබේවා තිසරණ සරනින් සැම ව   ර
මෙ ල ක්   දිවට අදිපති සැම සුරිඳුන් අවස   ර
දෙ ස ක්   ඇතත් දුර හැර සිරි සලසනු නිරතු   ර
ම ද ක්   කියමි නෙලුම් තහංචිය මම කවි ක   ර

3. ස ත ට   කියමි වදනක් සිතු සේම අසන   ට
ස තු ට   වඩා පිළිගනු එය සමා වෙලා ම   ට
කෙ ත ට   බසින්නට පළමුව වැඳගන සුරිඳු   ට
පි හි ට   රැගෙන මිස නොබසිනු අද මේ කුඹුර   ට

4. බැ තී න්   නමදිමි මුනිදම සඟ තුන් රත්නෙ   ට
ච ර න්   දෙවන ගතිමි අයැද සැම දෙවියන් හ   ට
මෙ මන්   අතේ ඇති සැම දෙස දුර හැර ඉවත   ට
දෙ ව න්   සුරිඳුනේ අවසර බසිනට කුඹුර   ට

5. ගු ව න්   තලේ ඉර සඳ දෙවි අතට තහංචි   ය
එ මෙ න්   දෙරණ මිහිකත් අනුහසින් තහංචි   ය
ව ටි න්   එසිවුවර දෙවි අනුහසට තහංචි   ය
අ ති න්   ගොයම් අල්ලන්නට කෙලෙමි තහංචි   ය

6. ගු ව න   තහංචිය නැත ඉර සඳ දෙවි බලයෙ   න
දෙ ව න   තහංචිය නැත මිහිකත් අනුහසයෙ   න
ව ටි න   කැපිම තහංචි සිවුවර දෙවි බලයෙ   න
මෙ ත න   තහංචිය කැපුවෙමි සැම දෙවි බලයෙ   න

7. දූ න් මා   සමගින් මේ නුඹ ආ මුත් තරහෙ   ට
බූ ම් මා   ගෙන ඉන්නට වෙයි උත්තර ඇසූ වි   ට
නා ම් මා   දෙ සවන් මෙ අසා දැනගනු යසස   ට
ස ම් මා   සම්බුද්ද කීවෙ කවුරුද මුනිඳු   ට

8. අ ම් මා   බිළිඳුට රස කිරි පොවනා විලසි   න
නි ම් මා   නැති සතුටු සිතින් ඇසුවෙමි එවද   න
පෙ ම් මා   මුනි දෙසූ දහමේ මම දුටු විලසි   න
ස ම් මා   සම් බුද්ධ කියා වැන්දෙ බ්‍රාහ්ම   න